# ජී.බී. සේනානායක හා විශාදය



වෛද්‍ය රුවන් ජයතුංග මහතා "මහා ගත්කරු ජී.බී. සේනානායක විශාදයෙන් (depression) පෙලුණේද" යන හිසින් මැයි මස සන්නසට රචනා කළ ලිපිය දැක මේ සටහන ලියා එවීමට සිත්විණි. 1965 හා 1972 පමණ වකවානුව තුල කඳාන අප නිවසට නුදුරින් වාසය කළ ජී.බී. එවක මම නිතර නිතර සියැසින් දැක ඇත්තෙමි. එසේම 1971 දී කීපවාරයක්ම පෞද්ගලිකව හමු වී මම ජී.බී. සමග සාහිත්‍ය හා අදාල මාතෘකා පිළිබඳව කථා බස් ද කර ඇත්තෙමි. ජී.බී. පිළිබඳව, විශේෂයෙන්ම, ඔහුගේ මානසික තත්වය පිළිබඳව ජයතුංග මහතා ඉදිරිපත් කර ඇති අදහස් පිළිබඳව යමක් පැවසීම උචිතයයි සිතමි.

ජයතුංග මහතාගේ ලිපියෙහි අන්තර්ගතය අංග දෙකකට බෙදා වෙන් කළ හැකිය. පළමුවැන්න, සාහිත්‍යධරයෙකු හැටියට ජී.බී. දැක්වූ නිර්මාණ කුසලතාව අදවනතුරු නිසි ඇගයීමකට ලක් වී නොමැති බවය. මෙය සාධාරණ සහේතුක ප්‍රකාශයක් ලෙස මටද පෙනේ. මෙයට හේතුව ජී.බී. පේරාදෙණිය ගුරුකුලයට අයිති නොවීමත්, කිසිවිටක ඒ ගුරුකුලයට ගැති නොවූ අදීන ලේඛකයෙකු හා විචාරකයෙකු වීමත් විය හැකිය. නූතන සිංහල නවකතාවේ ප්‍රමිතිය හා විශේෂයෙන්ම අද නවකථා බසෙහි පරිහාණියද පිළිබඳව මේ දිනවල මහත් කැක්කුමකින් කථා කරන සුචරිත ගම්ලත් වැනි වියතුන් පවා ජී.බී. සේනානායක පිළිබඳව බොහෝ විට මුනිවත රකින්නේද මෙම කුහක වතේම කොටසක් නිසාද? මගේ ලිපියේ මුඛ්‍ය අරමුණ මේ පිළිබඳව දිගින් දිගට කතා කිරීම නොවේ.

රචකයාගේ ලිපියේ මගේ සැලකිල්ලට භාජනය වූ අනෙක් අංගය නම්, ජී.බී. විශාදයෙන් පෙලුණේද යන මතය ස්ථාපනය කරනු අටියෙන් ඔහු ඉදිරිපත් කර ඇති තර්ක ය, සාධක ය. පදනමක් ඇත්තාක් සේ බැලූ බැල්මට පෙණුනද මේවා රචකයාගේ හුදු පෞද්ගලික පරිකල්පනයන් පමණි. තර්කානුකූල ලෙස පෙනුණද ඒවා තර්කානුකූල නොවේ. පිළිගත හැකි ප්‍රබල හෝ ඍජු සාක්ෂි එකකුදු රචකයා ඉදිරිපත් කර නැත. ජී. බී. ජීවතුන් අතර සිටින විට ජයතුංග මහතා ජී.බී. ව විධිමත් සායන පරීක්ෂණයකට ලක් කර ඇති බවක් හෝ ජී.බී. පෞද්ගලිකව දැක කථා බස් කර ඇති බවක් ද සඳහන් නොවේ. ඔහුගේ ප්‍රයත්නයේ පදනම වී ඇත්තේ ජී.බී. ගේ ඇතැම් නිර්මාණ වලින් සිය මනාපයට සරිලන එහෙන් මෙහෙන් අහුලා ගත් ඇතැම් දේ, කරුණු නැත්නම් සාක්ෂි ලෙස සලකා, ඒවා විශාදයේ ලක්ෂණ ලෙස වෛද්‍ය විද්‍යාවේ පිළිගත් ඇතැම් ලක්ෂණ හා එකට ඈඳා ජී.බී. විශාදයෙන් පෙලුනේද යන සිය කුකුස සනාථ කිරීමය. මෙය නොසැලකිලිමත්, අපරිණත සාහසික ප්‍රයත්නයකි. ඔහුගේ ලිපියෙහි අන්තර්ගතය ප්‍රාණය යන තුරු ජී.බී. ආදරයෙන් බලා කියා ගත්

*නවකථා අධ්‍යයනය කිරීමෙන් බොහෝවිට අපට හසුවන්නේ කථාකරු-වාගේ මති මතාන්තර හා අදහස් මිස ඔහුගේ පෞද්ගලික චරිත ලක්ෂණ නොවේ.*

තවමත් ජීවතුන් අතර ඔහුගේ ඥාතීන්ට දුකක් ගෙනදිය හැකිය.

රචකයා සිය මතය ස්ථාපනය කරනු අටියෙන් ජී.බී.ගේ චරිතාංගයන්ගේ වට්ටෝරුවකින් සිය ලිපිය සරසා ඇත. මේවා නම් -
- ජී.බී. මෙලන්කොලියාවෙන් (Melancholia) පෙලුනෙකි.
- ඔහු සමාන්‍ය මෙලන්කොලියාවෙන් එපිට වර්ධනය වූ විශාදයෙන් පෙලුනේද විය හැකිය.
- ජී.බී. තමා පිළිබඳ හීනවූ චිත්‍රයකින් හා හීනවූ අභිමානයෙන් (Low self esteem) පෙලුනෙකි.
- ආක්ෂොභිත භාවය (Agitation)" ස්වයං අනුකම්පාව (Self Pity)" ශූන්‍යවාදී අදහස්, තමා විරූපී පුද්ගලයෙකු යැයි සිතීම ඔහුගේ චරිත ලක්ෂණයන්ය.
- ජී.බී. ස්වයං හුදකලාභාවයකට (Agitation) තමාව ලක්කොට සිටි අතර ඔහු ස්වයං වරදකාරී ගැටළුවෙන් පෙලුනෙකි.
- කුඩාකල සිට නිතර හැදුණු හිසරදය මනෝකායික රෝගී ලක්ෂණයක් විය හැකිය.
- ආත්ම ඝාතනය හා ජීවිතාශාවෙන් තොරවීම යන ප්‍රවණාතවල සේයාවන් ජී.බී. තුල තිබිණි.
- ආත්ම ඝාතන සංකල්පය ඔහුගේ කවි හා නිර්මාණවල දැකිය හැකිය. (උදා: නයා)
- ජී.බී. ගේ හා වැඩිමල් සොහොයුරා ජීවිතය තොර කරගත්තේය.
- ආරොන් බෙක්ගේ න්‍යාය පරිදි ජී.බී.ට විශාදයේ ලක්ෂණ තිබිණි.
- විශාදයෙන් පෙලුණු අය අඳුරු අවපාතයකට එළඹෙන නමුදු (ජී.බී. වැනි) ඇතැම් අය විශාදය නිර්මාණය සඳහා උත්ප්‍රේරකයක් කර ගනිති. (මෙය ජයතුංග මහතාගේ න්‍යායක් සේ පෙනේ.)

කිසියම් රචකයෙකුගේ කතාවලින් දුක්මුසු, ශෝකාකූල බව පිළිබිඹු වූ පමණින් සැබෑ ජීවිතයේ දී ඔහු මෙලන්කොලියාව යන මානසික රෝගයෙන් පෙලුණේයයි සැක කිරීම කිසිසේත් බුද්ධිගෝචර නොවේ. මන්දයත් නිර්මාණශීලී සාහිත්‍යකරුවා සෑමවිටකම සිය පෞද්ගලික අත්දැකීම් සමූහයෙන් ඔබ්බට ගොස් තම නිර්මාණයට උවමනා කරන අමුද්‍රව්‍ය සිය ප්‍රතිභා ශක්තිය උපයෝගී කොටගෙන ප්‍රතිනිර්මාණය කරන හෙයිනි. මෙසේ ප්‍රතිනිර්මාණ කරන දෑ අතර චරිත චෛතසික ස්වභාව, තේමා වැනි නවකථාංග නිර්මාණාත්මක අවශ්‍යතා පාදක කොට මිස ගත්කරුවාගේ මනාප, අමනාපකම් රුචි අරුචිකම්, හෝ පෞද්ගලික චරිත ලක්ෂණ මත පිහිටා නොවේ. මේ කරුණු සලකා බලන විට මුද්‍රණ ද්වාරයෙන් පිටවූ සාහිත්‍ය නිර්මාණයක දක්නට ලැබෙන යම් යම් සාහිත්‍ය ලක්ෂණ හා රස් කේවලව විශ්ලේෂණය කර, එමගින් සාහිත්‍යකරුවාගේ

**මැක්සිමස් ජයන්ත අනන්දප්පා**
සිඩ්නි

චරිත ස්වභාවය චරිතාංග හා මානසික සෞඛ්‍ය පිළිබඳව නිගමනය කිරීම ඵලදායි නොවේ.

ටෝල්ස්ටෝයි, ඩස්ටවිස්කි, මර්ගනිජ්, ඩිකන්සි හා චැකොප් වැනි කථාකරුවන්ගේ ජීවිත කථා හා ඇතැම් චරිතාංග අපි හොඳාකාරව දනිමු. එයට හේතුව ජීවතුන් අතර සිටින විට ඔවුන් පිළිබඳව බොහෝ දේ ලියැවී ඇති නිසාය. මොවුන්ගේ නිර්මාණ තුළින් පමණක් ඔවුන්ගේ පෞද්ගලික චරිත ලක්ෂණ සොයා බලන්නෙකුට සිදුවන්නේ නිකම්ම වෙහෙසීමට පත්වීම පමණි. යුද්ධය හා සාමය හා ඇනා කැරණිනා වැනි නවකථාවල එන පියර් බෙසුහොෆ් හා ලෙවින් වැනි චරිත තුලින් ටෝල්ස්ටෝයි කෙබඳු පුද්ගලයෙකු වී දැයි සොයනවාට වඩා, මැක්සිම් ගෝර්කි විසින් ටෝල්ස්ටෝයි චරිතය පිළිබඳ ලියා ඇති සටහන් හැදෑරීම ඵලදායී බව කිව යුතුය. ෂේක්ස්පියර් පෞද්ගලිකව කෙබඳු පුද්ගලයෙකුදැයි ඔහුගේ කෘතී ඇසුරින් සෙවීමට තැත් කරනා මෝඩයෙකි; විරාගය ඇසුරින් වික්‍රමසිංහ චරිත ලක්ෂණ නිශ්චය කළ හැකිද ?

නවකථා අධ්‍යයනය කිරීමෙන් බොහෝවිට අපට හසුවන්නේ කථාකරුවාගේ මති මතාන්තර හා අදහස් මිස ඔහුගේ පෞද්ගලික චරිත ලක්ෂණ නොවේ. ස්වයං චරිතාපදාන සටහන් තුලින් රචකයෙකුගේ චරිතාංග පිළිබඳ දළ අදහසක් ලබා ගත හැකි වුවද, එමගින් රචකයා විශාදය වැනි මානසික රෝගයකින් පෙලුනේය වැනි දැවැන්ත තීරණයකට එළඹීම යෝග්‍ය නොවන බව මගේ හැඟීමය. කිසියම් රචකයෙකු විශාදයෙන් පෙලුනේද යන්න සායන වශයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් තීරණය කළ හැකි නම්, විශාදය ඔහුගේ නිර්මාණවලට කෙසේ බලපා ඇත්දැයි සෙවීම වෙනම කාරණයකි.

ජී. බී. ගේ නවකථාවල හා කෙටි කථාවල විශේෂයෙන් පසුකාලීන නිර්මාණවල ශෝකාකූල අසුබවාදී හෙවනැල්ල පතිත වී ඇති බව සැබෑය. ඔහුගේ ඇතැම් සුරංගනා කථාවල පවා මේ ඡායාව දැකිය හැකිය. ඔහුගේ සුරංගනා කථාවල ඉමහත් චමත්කාර ජනක අංගයද මෙය වේ. මෙය සමාජයේ ස්වභාවයත්, මිනිස් සිතේ ස්වභාවයත් කියා පෑමට ජී. බී. ගත් නිර්මාණාත්මක උත්සහයේ සාර්ථක ඵලය මිස මෙලන් කොලියා-වෙන් හො විශාදයෙන් නිර්මාණයට පිවිසි දෙයක් හැටියට පෙන්වීම අතිශයින් සදොස්ය, එය ජී. බී. ගේ අනූපම කලා කෞෂල්‍යට කළ හැකි ලොකුම නිග්‍රහයද වේ.

ජී. බී. උපත ලද්දේ 1913 දීය. ඔහුගේ -දුප්පතුන් නැති ලෝකය" පළ වූයේ 1944 දී පමණය. -පළිගැනීම" කෙටි කථා සංග්‍රහය මුද්‍රණ ද්වාරයෙන් පිටවූයේ 1947දීය. මේ ග්‍රන්ථ දෙකට ඇතුලත් වූ සියළුම කථා වයස අවුරුදු 30 හා 34 අතර පබැඳුණු ඒවා ලෙස සැලකීම සාධාරණය. ජී.බී. නවකථා කරණයට එළඹියේ ඉන් දශක දෙකකට පමණ පසුව, හැටගණන්වල මැද භාගයේ දීය. අන්ධ වූ පසුද ජී.බී. සිය සොහොයුරාගේ බිරිය හා ඇගේ දියණියගේ ද උපකාර ඇතිව නවකථා පොත් විශාල සංඛ්‍යාවක් බිහිකළේය. සංඛ්‍යාත්මකව මෙය 15ක් පමණ වී යයි සිතමි. මේවා නිර්මාණය වූයේ කියවන විට ලිවීම හෙවත් ඩික්ටේෂන් ක්‍රමයටය. ජී.බී. අප අතරින් වෙන් වී ගියේ 1985 දීය. ඔහු පූර්ණ අන්ධභාවයට පිවිසියේ අසූව දශකයේ මුල් භාගයේදීය.

ජී.බී. ඉතා සංවේදී පුද්ගලයෙකු වූ අතර ඔහුගේ පෙනුම අප ලස්සනයයි පිලිගත් සම්මතයට ප්‍රතිවිරුද්ධ වීය. අසාධාරණ විචාරයන්ගෙන් ඔහු සැලුණේ ඉන් තම පොත්වල අලෙවිය අඩුවීය යන භීතිය නිසා මිස ආත්ම අනුකම්පාව නිසා නොවේ. ඔහුගේ එකම ආදායම් මාර්ගය වූයේ පොත්වලින් ලැබුණු සුළු මුදලය. එකල රක්ෂාව සඳහා පොත් ලියවීම කළ එකම රචකයා ජී.බී. යයි මම සිතමි. (මාටින් වික්‍රමසිංහ පවා එවක සිත්මිණ පුවත් පතේ කතෘවරයා වීය.) පොත් ලියා ලැබුණු සුළු මුදල, ජී.බී. ට පමණක් නොව, එකල ආර්ථික අහේනියට ලක්වී සිටි, ජී.බී. නැවතී සිටි සිය වැඩිමහල් සොහෙ-ායුරා හා ඔහුගේ පවුලේ උදවියේ නඩත්තුවට ද මහා අත්වැලක් වීය. මෑතකදී මිය ගිය ධීමතී සේනානායක පිළිබඳව 2010. 06. 13 ඉරිදා ලක්බිම සංග්‍රහයේ පළවූ ලිපියද ජී.බී. ගැන උනන්දුවක් දක්වන සහෘදයන් විසින් කියවිය යුක්තකියි සිතමි.

ජී.බී. ගේ ඇතැම් කථා හැම අතකින් කපා ඔපමට්ටම් කළ දීප්තිමත් මිණිකැට වැන්න. -පලිගැනීම" කෙටි සංග්‍රහයට ඇතුලත් වූ -බිසෝ මැණිකා" එක් උදාහරණයක් පමණි. මෙවැනි කථා පසු කාලයකදී රචනා කළ -ගමන" යන කෙටි කථා සංග්‍රහයට ද ඇතුලත් වූ බව මතකය. -බිසෝ මැණිකා" වූ කලී මහා ශ්‍රේෂ්ඨ නවකථාවක, ශ්‍රේෂ්ඨ සම්පිණ්ඩණයක් වැන්න. විශාදයෙන් පෙලෙන අයකු විසින් මෙවැනි මිණිකැට වන් නිර්මාණ බිහිකළ හැක්කේ කෙලෙසද ? පූර්ණ අන්ධභාවයට පත් වූ පසු, තමා පත්ව ඇති අසරණභාවය හේතුකොටගෙන, විශාදය වැනි මානසික රෝගයකින් පෙලීමට ඉඩකඩ තිබිණියි අනුමාන කළ හැකි වූවද, වයස 67 දී වැනි පරිණත මුහුකුරා ගිය වයසකදී මෙවැනි අවාසනාවන්ත තත්වයක් අත්විණි නම්, වෛද්‍ය ප්‍රතිකාරවල පිහිට නොමැතිව, අවුරුදු හතරක පමණ කාලය තුල නිර්මාණ කෘතීන් 15ක් වැනි සංඛ්‍යාවක් ඔහු අතින් නිර්මාණය වන්නේ නැත.

ජයතුංග මහතාගේ ලිපියේ හිඩැස්, පලුදු, සදොස්

42 වන පිටට

